# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## අතරගල්ල එක්සත් ප්‍රජා සංවර්ධන පදනම
## (සංස්ථාගත කිරීමේ)

**අතරගල්ල එක්සත් ප්‍රජා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මයන්ත දිසානායක මහතා විසින්
2015 දෙසැම්බර් මස 15 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 නොවැම්බර් මස 23 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[55 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 13.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

# අතරගල්ල එක්සත් ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ)

## අතරගල්ල එක්සත් ප්‍රජා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

“අතරගල්ල එක්සත් ප්‍රජා සංවර්ධන පදනම” යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන කාර්යායතනයක් එකී සාමාජිකයන් විසින් එකඟ වන ලද රීතිවලට අනුකූලව ඒ අදාළ සියලු පරමාර්ථ හා කරුණු සාර්ථක ලෙස ඉටුකරගෙන යාමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාව පුරා ක්‍රියාත්මක කරගෙන යන හෙයින් ද :

එකී කාර්යායතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් කාර්යායතනය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් සහ එකී කාර්යායතනය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත සඳහා වන හෙයින්ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2015 අංක දරන අතරගල්ල එක්සත් ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

අතරගල්ල එක්සත් ප්‍රජා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම.

**2.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු “කාර්යායතනය” යනුවෙන් සඳහන් කරනු ලබන) අතරගල්ල එක්සත් ප්‍රජා සංවර්ධන පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ අතරගල්ල එක්සත් ප්‍රජා සංවර්ධන පදනමට මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු “සංස්ථාව” යනුවෙන් සඳහන් කරනු ලබන) “අතරගල්ල එක්සත් ප්‍රජා සංවර්ධන පදනම” යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන අතර, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි වන්නේ ය. තව ද, පොදු මුද්‍රාවක් තබාගැනීමේ හා එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එම මුද්‍රාව වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(1) මෙම පදනමේ දර්ශනය, පොදු පරමාර්ථ, පොදු ප්‍රතිපත්ති සහ සංවර්ධන වැඩසටහන් ශ්‍රී ලංකාව තුළ ජීවත්වන ජනතාවට අවබෝධ කරදීම, ස්වශක්තිය හා සාමූහිකත්වය ගොඩනැංවීම සහ ජනතා සහභාගීත්වයෙන් ඒවා ක්‍රියාත්මක කිරීම;

(2) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන විවිධ ආයතන, සමාගම්වලට අවශ්‍යවන මග පෙන්වීම සහ සමායෝජනය ලබාදීම ;

(3) පහත දැක්වෙන මූලික මානුෂික අවශ්‍යතා සපුරාලීමෙහිලා ප්‍රතිපත්ති සහ සැලසුම් සෑදීම, ඒවා ක්‍රියාත්මක කිරීම සහ ප්‍රතිඵල ඇගයීම සම්බන්ධයෙන් අවශ්‍ය නායකත්වය සැලසීම —

(අ) පරිසරය ;
(ආ) ජලය ;
(ඇ) ඇඳුම් ;
(ඈ) ආහාර ;
(ඉ) නිවාස ;
(ඊ) සෞඛ්‍ය ;
(උ) අධ්‍යාපනය ;
(ඌ) සංස්කෘතික සහ අධ්‍යාත්මික අවශ්‍යතා ;

(4) අධ්‍යාත්මික සංවර්ධනය ඇති කරමින් යහපත් රටක් ගොඩනැගීමට කැපවීම ;

(5) පරිසර සංරක්ෂණය, පරිසර දූෂණය වැලැක්වීම සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(6) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරගෙන යන ආයතන සමග ද සම්බන්ධතා පවත්වන ආයතනය වශයෙන් ක්‍රියා කිරීම.

සංස්ථාවේ පොදු ප්‍රතිපත්ති.

**4.** පදනමේ සාමාජික සාමාජිකාවන් විසින් පහත සඳහන් පොදු ප්‍රතිපත්ති පිළිපැදීමට උත්සාහ දැරිය යුතු ප්‍රතිපත්ති ලෙස පිළිගනු ලැබේ :—

(1) සෑම අවස්ථාවේදීම සත්‍ය, අහිංසාව සහ ආත්මහරණය පිළිපැදීම ;

(2) පදනමේ, පාරිශුද්ධිය ආරක්ෂා කරවීමේ අභිප්‍රායෙන් පක්ෂ දේශපාලන සම්බන්ධතා ඇති කර නොගැනීම ;

(3) චාම් දිවිපැවැත්මක අරමුණු ක්‍රමයෙන් ඉටුකර ගැනීම ;

(4) පෞද්ගලික ධන හිමිකම්, තරගය, වෛරය, තෘෂ්ණාව මුල්කොට ඇති වර්තමාන ජීවන ක්‍රමය වෙනුවට පොදු අයිතිය, සහයෝගය, දයාව මත ගොඩනැගුණු සමාජ ක්‍රමයක් අහිංසාවාදී මාර්ගවලින් ගොඩනැංවීමට උත්සාහ කිරීම ;

(5) ආයතනයේ, පදනමේ පරමාර්ථ ඉෂ්ට කර ගැනීම සඳහා උපයෝගී කර ගන්නා මාර්ග යහපත් හා පිරිසිදු ඒවා විය යුතු බව පිළිගැනීම ;

(6) අපේ සංස්කෘතික උරුමයන් වූ මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සතර බ්‍රහ්ම විවරණයෙන් ද දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සාමානාත්මතාව නම් වූ සතර සංග්‍රහ වස්තු මුල්කොටගත් ධාන්‍යාගාරයක් සහ ධර්මද්වීපයක් බවට ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීම සඳහා කැපවීම ;

(7) සාමාජිකත්වය ලබා ඇති අය විධායක මණ්ඩලයේත්, අධ්‍යක්ෂ මණ්ඩලයේත් තීරණවලට කීකරු විය යුතු බව පිළිගැනීම සහ තීරණවලින් යම් සාමාජිකයකුට සාමාජිකත්වය අහිමි බව ප්‍රකාශ වන්නේ නම් සිය කැමැත්තෙන් ඉල්ලා අස්වීම තමන් ගන්නා එකම පියවර බවට ප්‍රතිඥා දීම ;

(8) සාමාජික, දේශපාලන, සදාචාරාත්මක හා ආර්ථික වශයෙන් සම්පූර්ණ අහිංසාවාදී විප්ලවයක් ගමෙහි, නගරයෙහි ඇති කිරීමේහිලා ආයතනය විසින් ගත් පළමු පියවර ශ්‍රමදාන බව අවබෝධ කරගෙන යුක්තිය, සමානාත්මතාව ප්‍රධාන ලක්ෂණය කොට කවර අන්දමේ හෝ පෙළීම්වලින් තොර සමාජ ක්‍රමයක් බිහිකිරීම සඳහා කාලෝචිතව ගන්නා සෙසු පියවර සහ ක්‍රියාමාර්ග ගැන සැලකිලිමත්ව සේවය කිරීම ;

(9) විද්‍යා ඥානය හා අධ්‍යාත්මික ගුණ වගාව සමතුලිත ලෙස එක්වන ග්‍රාමීය හා නාගරික ප්‍රජාවන්ගෙන් සැදුණු නිදහස් ජනරජයන් රටවල් තුළ ඇතිවීම ද සාමය, සහයෝගය, ජාතීන්ගේ නිදහස පදනම් වූ එක්සත් පොදුරාජ්‍ය

මණ්ඩලයක් ලෝකයේ ඇතිවීමට ද ලෝක සාමය සහ මනුෂ්‍ය සංහතියේ උපරිම සතුට ළඟාවෙන මාර්ගය බව අවබෝධ කරගෙන, ඒ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා වෙර දැරීම;

(10) ලංකාවේ විවිධ ආයතනවලට ආදර්ශමත් වන පරිදි සමගිව රැස්ව, සමගිව සාකාච්ඡා කොට සමගිව පදනමේ කටයුතු නිමවා, සමගිව විසිර යාමේ ප්‍රතිපත්තිය පිළිපැදීම.

සංස්ථාවේ සාමාජිකත්වය.

**5.** පදනමේ සාමාජිකත්වයට පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය:—

(1) පදනමේ සාමාජිකත්වය සීමා රහිත වේ ;

(2) ජනතාව උදෙසා කරන ලද සේවය පිළිගැනීමක් වශයෙන් පදනමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආරාධිත සාමාජිකත්වය දැරීමට ආරාධනා කරනු ලබන පූජ්‍ය පක්ෂයට සහ රාජ්‍ය නිලධාරීන්ට විවෘතව ඇත්තේ ය ;

(3) සාමාජිකත්වය සඳහා නියමිත ආකෘතියෙහි ලා වූ ඉල්ලුම් පත්‍රය සාමාජික මුදල සමග පදනමේ ප්‍රධාන ලේකම් වෙත ලැබුණු විට, ඒ ඉල්ලුම්කරුට සාමාජිකත්වය දීම සඳහා විධායක මණ්ඩලය විසින් සලකා බලා තීරණය කරනු ලැබේ ;

(4) සාමාජිකත්වයට ඇතුළත්වීමෙන් පසුව එම සාමාජිකයන් විසින් පදනමේ පරමාර්ථ සහ ප්‍රතිඥාව පිළිගන්නා ලදැයි සලකනු ලැබේ ;

(5) පදනමේ සාමාජිකත්වය ඇතුළත් කර ගැනීම, සාමාජිකත්වය දීම, ප්‍රතික්ෂේප කිරීම සාමාජිකත්වය අත්හිටුවීම සහ සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් සියලු බලතල, පදනමේ අධ්‍යක්ෂ මණ්ඩලයට හා සභාපතිවරයාට ඇත්තේ ය;

(6) සාමාජිකත්වය පිළිබඳ විනයානුකූල අදාළ කරුණුවලදී හේතු දැක්වීමට පදනමේ අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී නොමැති නමුදු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම තීරණය ස්ථිර කරනු ලැබීම සඳහා පදනමේ මහා සභා රැස්වීම ඉදිරියෙහි තැබිය යුතු ය;

(7) සාමාජිකත්වය ශ්‍රේණි පහක් වේ. එනම් ළමා සාමාජිකත්වය, යොවුන් සාමාජිකත්වය, සාමාන්‍ය සාමාජිකත්වය, යාවජීව සාමාජිකත්වය සහ ආරාධිත සාමාජිකත්වය යනුවෙනි;

(8) වයස අවු. 07 සම්පූර්ණ කළ එහෙත් අවුරුදු 14 සම්පූර්ණ නොකළ තැනැත්තන් ළමා සාමාජිකයන් යනුවෙන් ද, වයස අවුරුදු 14 සම්පූර්ණ කළ එහෙත් අවු. 26 සම්පූර්ණ නොකළ තැනැත්තන් යොවුන් සාමාජිකයන් යනුවෙන්ද , වයස අවුරුදු 26 ඉක්මවා ඇති තැනැත්තන් සාමාන්‍ය සාමාජිකයන් යනුවෙන් ද, මෙහි සාමාජික ගාස්තු ගෙවන තැනැත්තන් යාවජීව සාමාජිකයන් යනුවෙන්ද, ආරාධනා ලබන තැනැත්තන් ආරාධිත සාමාජිකයන් යනුවෙන් ද හඳුන්වනු ලැබේ;

(9) කිසිම සාමාජිකයකුට පදනමේ සාමාජිකත්වය මත පෞද්ගලික ස්වභාවයෙන් කිසිම ඵල ප්‍රයෝජනයක් ලබා ගත නොහැක.

**6.** සාමාජික ගාස්තු —

සංස්ථාවේ සාමාජික ගාස්තු.

(i) සාමාජික ගාස්තු ළමා සාමාජිකයකු වර්ෂයකට රු. 1 ක් දායක මුදල වශයෙන් ගෙවිය යුතු ය ;

(ii) යොවුන් සාමාජිකයකු වර්ෂයකට රු. 6 ක් දායක මුදල වශයෙන් ගෙවිය යුතු ය ;

(iii) සාමාන්‍ය සාමාජිකයකු වර්ෂයකට රු. 24 ක දායක මුදලක් ගෙවිය යුතු වේ;

(iv) එකවර රු. 240 ක් ගෙවීමෙන් හෝ සාමාජිකත්වය ලැබූ දින සිට එක් අවුරුද්දක් ඇතුළත දී සමාන වාරික තුනකදී එකී මුදල ගෙවා සම්පූර්ණ කරන සාමාජිකයන් යාවජීව සාමාජිකයන් වශයෙන් සලකනු ලැබේ;

(v) සාමාජිකයන් සාමාජික මුදල ගෙවීමට ඇති නමුදු ස්වකීය අභිමතය පරිදි පදනමට පරිත්‍යාග කළ හැකි ය;

(vi) ළමා, යොවුන් හා සාමාන්‍ය ශ්‍රේණිවල සාමාජිකයන් සෑම අලුත් වර්ෂයකම නියමිත සාමාජික මුදල වර්ෂයේ ජනවාරි 31 වන දිනට පෙර ගෙවා තම සාමාජිකත්වය අළුත් කර ගත යුතු ය;

(vii) පදනමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය හෝ ඉල්ලා අස්වීමෙන් හෝ වෙනත් යම් මාර්ගයකින් හෝ ස්ව සාමාජිකත්වය අහිමිකර ගන්නා සාමාජිකයන්ට තමන් සාමාජිකත්වය දරමින් සිටි කාලයේ පදනමට ගෙවා ඇති යම් මුදලක් හෝ ආපසු ලබාගැනීමට ඉල්ලා සිටීමට හිමිකම් නොමැත්තේ ය.

සාමාජිකත්වය ලියාපදිංචි කිරීම.

**7**. නාම ලේඛනයට පහත සඳහන් තොරතුරු ඇතුළත් විය යුතු ය :—

(1) සංස්ථාවේ එක් එක් සාමාජිකයන්ගේ නම්, සාමාජිකත්ව ස්ථිර ලිපිනය, සාමාජිකත්වය ලබා ගත් දිනය;

(2) සාමාජිකත්වය අහිමිවූ දිනය සහ අවශ්‍ය යයි සංස්ථාවේ ප්‍රධාන ලේකම් අදහස් කරන වෙනත් යම් අදාළ තොරතුරු ද දැක්වෙන ලේඛනයක් ලේකම්වරයා විසින් පවත්වාගෙන යා යුතු ය.

සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය.

**8**. අධ්‍යක්ෂ මණ්ඩලය —

(1) වාර්ෂික මහා සභා රැස්වීමේ දී තෝරා ගන්නා ලද එක් එක් ශ්‍රේණියට අයත් සාමාජිකයන් 15 කට නොවැඩි විධායක මණ්ඩලයක් මගින් සංස්ථාවේ සියලු ක්‍රියාකාරකම් මෙම රීතිවලට අනුකූලව පාලනය කළ යුත්තේ ය;

(2) අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් ආකාරයට තෝරාගනු ලැබිය යුතු ය:—

(අ) ළමා සාමාජිකයන් දෙදෙනෙක් ;

(ආ) යොවුන් සාමාජිකයන් තිදෙනෙක් ;

(ඇ) සාමාන්‍ය සාමාජිකයන් අතරින් මව්වරුන් තිදෙනෙක් ;

(ඈ) සංස්ථාවේ මහා සභා රැස්වීමේ දී පූජ්‍ය පක්ෂය, සාමාන්‍ය යාවජීව සාමාජිකයන් සහ ආරාධිත සාමාජිකයන් අතරින් තෝරාගන්නා වැඩිහිටි සාමාජිකයන් හය දෙනෙක් ;

(ඉ) සාමාන්‍ය හෝ යොවුන් සාමාජිකයන් අතරින් තෝරා ගනු ලබන තවත් සාමාජිකයන් තුන් දෙනෙක්.

(3) කවර හෝ මහා සභා රැස්වීමක දී ඡන්දය දෙන පදනමේ සංඛ්‍යාවක් වශයෙන් තුනෙන් දෙකකට වැඩි ඡන්දයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සාමාජිකයකු පදනමේ පොදු ප්‍රතිපත්තිවලට සහ පරමාර්ථවලට පටහැනිව ක්‍රියාකිරීමේ හේතුව මත ස්වකීය ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. ඒ සාමාජිකයා සම්බන්ධයෙන් ඒ සභා රැස්වීමේ දී ගනු ලබන තීරණය අවසානාත්මක විය යුතු අතර, ඒ කිසිදු අධිකරණයක දී ප්‍රශ්න කිරීමට සාමාජිකයා හිමිකම් නොලබන්නේ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ රීති.

**9.** සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි කටයුතු කළ යුතු ය :—

(1) පදනමේ අධ්‍යක්ෂ මණ්ඩලය අඩුම වශයෙන් මසකට එක්වරක් හෝ රැස්විය යුතු ය;

(2) අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් 7 කි;

(3) මහා සභා රැස්වීම අවසන් වූ දිනයේ ම අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රථම රැස්වීම පවත්වා පදනමේ සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික තෝරාගනු ලැබිය යුතු ය;

(4) පදනමේ සාමාන්‍ය පරිපාලන කටයුතු පිළිබඳව සියලුම තීරණ ගැනීමේ බලය පදනමේ සභාපතිවරයා සතු ය;

(5) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සභා රැස්වීම සඳහා මාසයේ සුදුසු දිනයක් නියම කරගත යුතු ය;

(6) පූර්ණ දින තුනකට කලින් ලිඛිතව දැනුම් දීමෙන් පසු අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම පවත්වනු ලැබිය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**10.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව—

(1) සංස්ථාවේ පරමාර්ථ සඳහා අවශ්‍ය විය හැකි ඉඩම් හෝ ගොඩනැගිලි මිලදී ගැනීම, අත්පත්කර ගැනීම, කුලියට ගැනීම, ඉදිකිරීම හෝ වෙනත් ආකාරයකින් ලබාගැනීම;

(2) පදනමේ ප්‍රයෝජනය සඳහා ඉඩම්, ගොඩනැගිලි, උපකරණ හෝ මුදල් පරිත්‍යාග වශයෙන් හෝ බැංකු ණය ආදී වෙනත් සුදුසු ක්‍රම මගින් අත්කර ගැනීම සහ පදනමේ පරමාර්ථ උදෙසා ඒවා උපයෝගී කර ගැනීම සහ ආයෝජනය කිරීම;

(3) පදනමේ අරමුණුවලට අදාළ පරිදි වෙනත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(4) පදනමේ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන් ගේ සාමාජිකත්වය අත්හිටුවීම සහ අස් කිරීම;

(5) නිලධාරීන්ට කාර්ය වෙන්කර දීම හා ඔවුන්ගේ විනය පාලනය;

(6) අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යන ධුරවල ඇතිවන පුරප්පාඩු පිරවීම;

(7) උප කමිටු පිහිටුවා ඒවාට කාර්ය නියම කිරීම හා විසුරුවා හැරීම;

(8) ඒ ඒ සමිති සමාගම් මගින් කෙරෙන ග්‍රාමෝදය වැඩ කටයුතු සංවිධානය කිරීම සහ එම කාර්ය පූර්ණ කාලීන සේවකයන්, පෙර පාසල් පාලිකාවන්, පොදු මුළුතැන්ගෙවල් සේවිකාවන්, සෞඛ්‍ය සේවිකාවන්, දාරකාගාර සේවිකාවන් සහ ග්‍රාමෝදය සේවක සේවිකාවන් පත් කිරීම හා ඉවත් කිරීම;

(9) ප්‍රධාන ලේකම් මගින් ආයතන ලිපි ලේඛන ආදිය පවත්වාගෙන යාම සහ ඒවා සුරක්ෂිතව තැන්පත් කොට තැබීම;

(10) පදනමේ සියලුම ගිණුම් පරීක්ෂා කිරීම සඳහා සමිති ආඥා පනත යටතේ අනුමත කරන ලද විගණකවරුන් පත් කිරීම ;

(11) එකී විගණකවරුන් විසින් පරීක්ෂා කොට සහතික කරන ලද වාර්ෂික ගිණුම් වාර්තාව මහා සභා රැස්වීමට ඉදිරිපත් කිරීම;

(12) වෙනත් සමිති සමාගම් සමග සුහද සම්බන්ධතා තහවුරු කර ගැනීම;

(13) පදනමේ වාර්ෂික මහා සභා රැස්වීම සහ විශේෂ සභා, සාමාන්‍ය මහා සභා රැස්වීම් කැඳවීමට ලේකම්ට දැනුම් දීම.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ කාර්ය භාරය.

**11.** (1) සභාපති—

(i) සභාවේ මුලසුන දැරීම;

(ii) සමිතියේ සියළු කටයුතු පරීක්ෂා කිරීම සහ මෙහෙයවීම;

(iii) අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ මහා සභා රැස්වීමට ඉදිරිපත් කිරීම;

(iv) අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත සාමාජිකයන් ඉවත් කිරීම.

(2) ලේකම් —

(i) වාර්ෂික සහ අනෙකුත් මහා සභා රැස්වීම් සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම, පදනමේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තා පවත්වාගෙන යාම, පදනමේ ලිය කියවිලි අත්සන් තැබීම, සහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තමන් වෙත පවරනු ලබන වෙනත් කාර්ය ඉටු කිරීම;

(ii) සංස්ථාවේ සියලු ලිපි ලේඛන තමා භාරයේ පවත්වාගෙන යාම සහ ඒවා ආරක්ෂා කිරීම;

(iii) සෑම වසරකම ජුනි මස 30 වන දිනට පෙර සංස්ථාවේ සාමාජිකයන් පිළිබඳ විස්තරයක් සමිති රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කිරීම කළ යුතු ය.

(3) භාණ්ඩාගාරික—

(i) සංස්ථාවේ සියලු මුදල්වල ආරක්ෂාව භාරව හා අධ්‍යක්ෂ මණ්ඩලයේ විධාන පරිදි හා සභාපතිවරයාගේ අණ පරිදි විය පැහැදම් කිරීම;

(ii) ලැබීම් සහ ගෙවීම් පිළිබඳ නිසි පොත් පත් ක්‍රමවත්ව පවත්වාගෙන යාම;

(iii) සංස්ථාවට අයත් සියලු උපකරණ හා දේපළ සම්බන්ධයෙන් අවශ්‍ය බඩු වට්ටෝරු සහ ලේඛන තබා ගැනීම;

(iv) සංස්ථාවේ සියලු මුදල් නිලධාරි මණ්ඩලය පිළිගත් බැංකුවක අනිවාර්යෙන්ම තැන්පත් කිරීම සහ ඒවා අවශ්‍ය පරිදි පදනමේ කටයුතු සඳහා පරිහරණය කිරීම ;

(v) වාර්ෂික ගිණුම් වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලයට හා මහා සභාවට ඉදිරිපත් කිරීම ;

(vi) ගිණුම් වාර්තාව සෑම වර්ෂයකදීම ජුනි මස 30 වන දිනට පෙර සමිති රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කිරීමද කළ යුතු වන්නේ ය.

සංස්ථාවේ උප කමිටු පත් කිරීම.

**12.** අවශ්‍ය සෑම අවස්ථාවක දී පහත සඳහන් අන්දමේ කාර්ය සඳහා උප කමිටු පත් කිරීමට සභාපතිවරයාට හා අධ්‍යක්ෂ මණ්ඩලයට බලය තිබිය යුතුය:—

(අ) ශ්‍රමදාන කඳවුරු, අධ්‍යාපනික සම්මන්ත්‍රණ, ඉතිරි කිරීම් හා ණය ගනු දෙනු, පොදු වෙළෙඳසැල්, ප්‍රදර්ශන, ළමා සුභසාධන කටයුතු, අධ්‍යාපන ගමන්, පැල සිටුවීමේ ව්‍යාපාර, ගෙවතු වගා ව්‍යාපෘති සහ ආර්ථික සංවර්ධන ව්‍යාපෘති වැනි කාර්ය;

(ආ) සාමාජිකයකු විසින් කරන ලදැයි චෝදනා නගන ලද වැරදි හැසිරීම් හෝ ධුර දරන්නකු පදනම අයථා ලෙස පරිහරණය කලේ යැයි පැමිණිලි ඇති වූ විට හෝ ඒවා විභාග කිරීම;

(ඇ) පදනමේ පරමාර්ථවලට අනුකූලව වෙනත් යම් කාර්ය;

(ඈ) උප කමිටුවකට අඩුම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් තුන්දෙනකු හෝ ඇතුළත් විය යුතු අතර, සෙසු අය සාමාජිකයන් අතරින් පත් කරනු ලැබිය හැක;

(ඉ) අවශ්‍ය විටක යම් කමිටුවක් විසුරුවා ඒ වෙනුවට අලුත් උප කමිටුවක් පත් කිරීමට සභාපතිවරයාට හා අධ්‍යක්ෂ මණ්ඩලයට බලය ඇත්තේ ය.

සංස්ථාවේ මහා සභා.

**13.** (1) සංස්ථාවේ මහා සභා රැස්වීම් වර්ග 3 ක් වේ. වාර්ෂික මහා සභා රැස්වීම, පදනමේ සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි සභාපති විසින් කැඳවනු ලබන විශේෂ මහා සභා රැස්වීම් හා සාමාන්‍ය මහා සභා රැස්වීම් යනුවෙනි.

(2) වාර්ෂික මහා සභා රැස්වීමේ වැඩසටහන අවසාන රැස්වීමේ කාර්ය සටහන්, ලේකම්ගේ වාර්ෂික වාර්තාව, භාණ්ඩාගාරිකගේ වාර්ෂික ගිණුම් වාර්තාව සහ ගිණුම් ප්‍රකාශන කියවා අනුමත කිරීම සහ ඉදිරි වර්ෂයට අධ්‍යක්ෂ මණ්ඩලය තෝරා ගැනීම ඇතුළත් වේ.

(3) පදනමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමත හා තීරණය පරිදි පවත්වනු ලබන විශේෂ මහා සභා රැස්වීම් වැඩසටහනට රීති සංශෝධනය කිරීම, ප්‍රතිශෝධනය කිරීම හෝ රීති මාලාව අලුත් කිරීම යන ඒවා පමණක් ඇතුළත් වේ.

(4) පදනමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් 6 දෙනකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් සභාපති වෙත ලිඛිතව ඉදිරිපත් කරන ඉල්ලීමක් මගින් ඉදිරිපත් කරනු ලබන විශේෂ මහා සභා රැස්වීමේ වැඩසටහනට එසේ ඉදිරිපත් කරන කාරණය පමණක් ඇතුළත් වේ.

(5) සභාපති විසින් හෝ පදනමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෝ අවශ්‍ය යයි අදහස් කරනු ලබන සාමාන්‍ය මහා සභා රැස්වීම්වල වැඩසටහනට සාකච්ඡා කළ යුතු වැදගත් කරුණු ඇතුළත් වේ.

(i) වාර්ෂික මහා සභා රැස්වීම අගෝස්තු මස 31 දිනට පෙර පැවැත්විය යුතු ය;

(ii) සියලුම මහා සභා රැස්වීම්වල මුලසුන පදනමේ සභාපතිවරයා විසින් දැරිය යුතු ය;

(iii) සියලු මහා සභා රැස්වීම් සඳහා ගණපූරණයට සාමාජිකයන් 50 දෙනකු නැතහොත් සාමාජිකයන් පිරිසෙන් තුනෙන් දෙකක් වන සාමාජික සංඛ්‍යාවක් සිටිය යුතු ය;

(iv) සමිතියේ සෑම සාමාජිකයෙක්ම මහා සභාවල සාමාජිකත්වයට සුදුසු අය වන අතර, ඔවුන්ට ඒවායේ සහභාගීත්වය දැරීමට හිමිකම් ඇත්තේ ය;

(v) සියලුම මහා සභා රැස්වීම් සඳහා යටත් පිරිසෙයින් දින 14 කට කළින් දැනුම් දීමක් මගින් කළ යුතු ය.

**14.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහා වෙනුවෙන් මෙතෙක් භාරගන්නා ලද හෝ මින්මතු භාරගනු ලබන සාමාජික මුදල්, පරිත්‍යාග, වෙනත් දේශීය ආයතනවලින් ලැබෙන ආධාර, සංස්ථාවට අයත් නිශ්චල හා චංචල දේපළවලින් ලැබෙන ආදායම, රජය මගින් හෝ ප්‍රදේශයේ ආයතන මගින් හෝ රාජ්‍ය නොවන වෙනත් දේශීය ආයතන මගින් දෙනු ලබන අධාර සභාපතිවරයා හා අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක, සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) සංස්ථාවේ දේපළ පුනරුත්ථාපනය, වැඩිදියුණු කිරීම හෝ සංවර්ධනය සහ සංරක්ෂණය සඳහා ඕනෑම ක්ෂය අරමුදලක්, සංචිත හෝ නිදන් අරමුදලක් පිහිටුවීමට සංස්ථාවට හැකි ය.

(3) මෙම අරමුදලින් —

(අ) පදනමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්වකීය කටයුතු කිරීම සහ සේවා ඉටුකිරීමෙහිලා යම් යම් වැය ශීර්ෂයන් යටතේ වියදම් කළ යුතු මුදල්;

(ආ) පදනමේ සේවක පිරිස සඳහා අවශ්‍ය දීමනා;

(ඇ) නිලධාරීන් සහ අනෙකුත් ස්වේච්ඡා සේවකයන් විසින් පදනමේ යම් යම් කටයුතු සඳහා කරන වියදම්;

(ඈ) තැපැල් ගාස්තු, විදුලි පණිවිඩ, දුරකතන ඇමතුම්, ලිපිද්‍රව්‍ය සහ මුද්‍රණ කටයුතු සඳහා කරන ගෙවීම්;

(ඉ) අධ්‍යක්ෂ මණ්ඩලය මගින් වෙන්කොට ඇති මුදලින් පුණ්‍යාධාර සඳහා කරන ගෙවීම්;

(ඊ) විගණනය සඳහා වූ ගාස්තු;

(උ) කාර්යාලීය සහ බඩු බාහිරාදිය මිලට ගැනීම සඳහා අවශ්‍ය මුදල් ගෙවනු ලැබිය යුතු ය;

(ඉ) චෙක්පත් පදනමේ නිලධාරීන් දෙදෙනකු විසින් අත්සන් කළ යුතු ය. එයින් එක් නිලධාරියකු පදනමේ භාණ්ඩාගාරික විය යුතු අතර, අනෙක් නිලධාරියා සභාපති හෝ ලේකම් විය යුතු ය.

**විගණනය හා ගිණුම්.**

**15.** (1) පදනමේ මුදල් වර්ෂය අප්‍රේල් මස පළවෙනිදා ආරම්භවන කාල පරිච්ඡේදය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබාගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ ''සුදුසුකම්ලත් විගණකවරයා'' යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නාවූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක, එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

සංස්ථාව විසින් නිශ්චල හා චංචල දේපළ දැරිය හැකි බව.

**16.** යම් මිළට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, යථායෝග්‍ය ආධාරයක්, ඇස්තමේන්තුවකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාව සතුවන්නා වූ චංචල හා නිශ්චල කවර දේපළක් වුවද භාරගැනීමටත්, දැරීමටත්, ඒවා සංස්ථාවේ පරමාර්ථ ඉෂ්ට කර ගැනීම සඳහා ප්‍රයෝජනයට ගැනීමටත් සංස්ථාවට බලය තිබිය යුතු අතර, සංස්ථාවේ තත්කාලයේ බල පවත්නා රීති වලට යටත් ව ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍ය ආකාරයකින් බැහැර කිරීමේ බලය ද පදනමට තිබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**17.** සංස්ථාවේ සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරනු ලබන මුද්‍රාවක් සංස්ථාවට තිබිය යුතු ය. සංස්ථාවේ සභාපති, ලේකම් භාණ්ඩාගාරික යන නිලධාරීන් තිදෙනාගෙන් දෙදෙනකු ඉදිරිපිට මිස මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඒ නිලධාරීන් දෙදෙනා තමන් පැමිණ සිටින බවට සාක්ෂියක් වශයෙන් ඒ සාධන පත්‍රයට ස්වකීය අත්සන් තැබිය යුතු ය.

සංස්ථාවේ රීති හා රෙගුලාසි සංශෝධනය කිරීම.

**18.** (1) සංස්ථාවේ රීති සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම ඒ කාර්ය සඳහා කැඳවනු ලබන විශේෂ මහා සභා රැස්වීමක දී ඒ යෝජිත සංශෝධනවලට පක්ෂව දෙන, පැමිණ සිටින සාමාජිකයන් ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් මිස කරනු නොලැබිය යුතු ය.

(2) ඒ ප්‍රතිශෝධන පරිච්ඡින්න කිරීම හෝ සංශෝධන, පදනමේ ලේකම් විසින් හෝ ඔහු පැමිණ නොමැති විටක, ඒ රැස්වීමේ මූලාසනය දරන තැනැත්තා විසින් හෝ විශේෂ මහා සභා රැස්වීමක දී යෝජනා කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ සාමාජික ආරාවුල්.

**19.** සංස්ථාවේ කටයුතු හෝ ක්‍රියාකාරීත්වය හෝ ඒ සම්බන්ධයෙන් සංස්ථාව හා එහි ද සාමාජිකයන් අතර යම් ආරාවුලක් උද්ගත වුවහොත් එය සංස්ථාවේ ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එහි ලා අධ්‍යක්ෂ මණ්ඩලය හා

සභාපති විසින් දෙනු ලබන තීරණය අවසානාත්මක වන්නේ ය. ඒ තීරණය කිසිම අධිකරණයක ප්‍රශ්න කරනු නොලබන අතර, ඒ තීරණය පිළිගෙන ඒ අනුව ක්‍රියාකිරීමට සාමාජිකයන් බැඳී සිටින්නේ ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**20.** මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හෝ හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**21.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.